මගේ අංකය / எனது இல. / My No. M5 / රෙජි / ගෙවන ගාස්තු

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2393071, 2393072

ෆැක්ස් අංකය / தொலைநகல் இல. / Fax No. 2393074

ඊ-මේල් / மின்னஞ்சல் / E-mail rgdept@sltnet.lk


**චක්‍රලේඛ අංක : 07/2005**


රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகம் திணைக்களம்

REGISTRAR – GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

280, මෙයින් වීදිය, කොළඹ 11.

280, பிரதான வீதி, கொழும்பு 11.

280, Main Street, Colombo 11.


දිනය / திகதி / Date 2005.06.22

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

**උප්පැන්න, විවාහ හා මරණ සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු, උඩරට විවාහ හා දික්කසාද පනත හා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ අයකරන ගාස්තු සංශෝධනය කිරීම.**

ඉහත සඳහන් ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධව ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින් පනවන ලද පහත සඳහන් රීති හා රෙගුලාසි 2005.06.08 දින පාර්ලිමේන්තුවෙන් අනුමත වී ඇත.

1. උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 69 වගන්තිය යටතේ පැනවූ රීති.
2. විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 7 හා 51 වගන්ති යටතේ පැනවූ රීති.
3. උඩරට විවාහ හා දික්කසාද පනතේ 47 වගන්තිය යටතේ පනවන ලද රීති.
4. මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 94 වන වගන්තිය යටතේ පනවන ලද රෙගුලාසි.

02. මෙකී සංශෝධනවලට අදාල 2004.12.16 දින හා අංක 1371/25 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පිටපතක් මෙ සමඟ ඔබ වෙත එවමි. මෙම සංශෝධන අනුව, උප්පැන්න, විවාහ හා මරණ සහතික පිටපත් නිකුත් කිරීමේ දී අයකරන ගාස්තු පහත පරිදි සංශෝධනය කර ඇත.

| කාරණය | සංශෝධිත ගාස්තුව<br>රු.ශ. |
|---|---|
| 1. සහතික කළ පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේදී ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය නොවන අවස්ථාවක, සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා. | 25.00 |
| 2. සහතික කළ පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේ දී මාස 03 ක් නොඉක්මවන කාල පරිච්ඡේදයක ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍යව වන සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා. | 50.00 |
| 3. සහතික කළ පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේ දී අවු.02 ක් නොඉක්මවන කාල පරිච්ඡේදයක ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය වන සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා. | 100.00 |